


3 කොටස

# බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව

*ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191ක් ගත වී ඇති මේ මොහොතේ 19වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලක්වී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු. අපි මේ කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නේ 892 දී ලියා පල කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාම්ස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය ඇසුරෙන් සකස් කළ ලිපි පෙළකි.*

# තල් පොල් සහ මුතු පබා



කොළඹ නුවර තැපැල් කරත්තය - බ්‍රිතාන්‍ය පාලන යුගය

**ශ්‍රියා කුමාරසිංහ** නවසීලන්තයේ සිට

ඉන්දිය සයුරේ පුළුල් ලැම මත රැ ඳුණු, වසන්තයේ පොබයා ආ දීප්තිමත් ලා දළුවක් බඳු ලංකාව, නැතහොත් පෙරදිග මුතු ඇටය ඇත්තෙන්ම හැඳින්විය යුතුව තිබුණේ තල්, පොල්, මුතු, අල ඇතුන්, පද්ම-රාග, කුරුඳු සහ විවිධ සුගන්ධයන් නිරායාසයෙන්ම මතකයට නැංවෙන පරිදි අනුරාගී දිවයින කියාය. අවුරුදු දෙදහසකට පෙර පර්සියානු බොක්කේ සිට සාගර තරංග ඔස්සේ පැමිණි අරාබි වෙළෙන්දෙක් මලය රටේ සුන්ඩා සිට චීනයේ ඈත කැති දක්වා වූ මුහුදු තීරයේ දිගේ සිය ලී නැංගුරම් ලා සිටියේය. සින්බෑඩ් නම් වු හෙතෙම ඉතා චමත්කාර වු අත්දැකීම් සමුහයක් ලැබුවේ මෙහිදීය. කාලිප් විසින් සෙරන්ඩිබ් හි රජු නමට ලියු ලිපියක්ද රැ ගෙන බසුරාවෙන් පිටත් වී ලංකාවට පැමිණි ඔහු රජ කුමරෙකුගේ රාජ සභාවේදී පිළි ගනු ලැබුවේය. කුමරාගේ ඉල්ලීම මත සින්බෑඩ් සිය ත්‍රාසජනක අත්දැකීම් රන් අකුරින් ලියන ලදුව එම රාජධානියේ ලේඛනාගාරයේ තැන්පත් කරනු ලැබිණ.(සටහන බී).

ලංකාව ඉපැරණි ෆිනීෂියාවේ තාෂිෂ් වෙරළ යයිද සමහරෙක් අපට කියති. බොහෝ දෙනා නානා විධ මති මතාන්තර ලියා ඇති නමුත් තවම සෑහීමකට පත් විය හැකි පිළිතුරක් ලැබී නැති එවැනි ගැටළු සහිත ප්‍රශ්නයකට යාමට පෙර මම මෙසේ කියමි. ඔබ අද මෙහි සිටින දෙමළ කුලී කරුවෙකුගෙන් වානරයෙකුගේ හෝ මොණරෙකුගේ නමක් ඇසුවහොත්, ඉපැරණි, නිර්මාණශීලී හීබෲ ලේඛකයින් විසින් එම සතුන් හඳුන්වා දුන් නම් වලින්ම ඔහු ඔබට පිළිතුරු දෙනු ඇත.

14වන සියවසේ ලියැවුණු එරික්ස් වීර කතා නම් වු අයිස්ලන්ත කතාන්තරයට අනුව (සමහරවිට මෙය පැරණි මිත්‍යාදෘෂ්ඨික ජන කතාවක ක්‍රිස්තියානි සංශෝධනයක් විය හැකිය.) නෝර්වේජියානුවෙකු අමරණීය භූමියක් සොයා යන ගමනක් ගැන අපි කියවා ඇත්තෙමු. ඔහු කෙසේ හෝ ඉන්දියාවට පැමිණ දින ගණනාවක් තිස්සේ ඝණ වනාන්තරයක් තුලින් ගොස් අනිත් කෙලවර පටු සමුද්‍ර තීරයකින් ප්‍රධාන ගොඩබිමෙන් වෙන්වු පාරාදීසයකට සම්ප්‍රාප්ත විය. එය අතිශය දැකුම් කළු, තණකොල පවා මනස්කාන්ත දම් පැහැයකින් බබලන, මලින් ගැවසුණ, නන් දෙසට ගලා යන දිය කඳුරු වලින් ගහණ තැනකි. රැ යක් හෝ අඳුරක් නැති වලාකුළු රහිත අහසකි. මල් සුවඳින් සුවඳවත් වු වාතයේ නිශ්චලත්වය අපුරුය. ආශ්වාසයෙන් ලැබෙන ආශ්වාදය සුවදායකය. එම පාරාදීසය අන් කිසිවක් නොව ලංකාවයි.
සමහරුන් මෙම දිවයින තවත් ජනප්‍රවාදයක එන ප්‍රෙස්ටර් ජෝන් හා සම්බන්ධ කර ඇත. දහතුන්වන සියවසේ හර්ෆෝඩ් සිතියමේ මෙම පාරාදීසය දක්වා ඇත්තේ ඉන්දියාව අසල රවුම් හැඩයෙන් යුත් දූපතක් ලෙසටයි. එම සිතියමෙහි මෙම දූපත මුහුදින් පමණක් නොව බටහිරට ඇරුණු දොරක් සහිත යුද ආරක්ෂක පවුරකින්ද වට කොට දක්වා ඇත. හියුගෝ වික්ටර් සිය දෙ සිටු ටෙරාරම් නමැති ග්‍රන්ථයේ ද මේ දූපත පිළිබඳව මෙසේ ඉඟියෙන් දක්වා ඇත. පාරාදීසයක් යනු පෙරදිගට වන්නට පිහිටි, සියළුම වර්ගවල ගහකොළ, තුරුලතා, පලතුරු වලින් සුසැදි තැනකි. එහි ජීවන වෘක්ෂය පිහිටා ඇත. සීතලක් හෝ උෂ්ණත්වයක් නැති නිරන්තර සමබර දේශගුණයක් පවතී.

තේම්ස් නදියේ මුව දොරකඩ සිට සැතපුම් 6700ක් දුරින්, සූවස් ඇල හා සමාන්තරව, කර්කටක නිවර්තනයේ අක්ෂාංශක 5.53,- 9.51 සහ දේශාංශක 79.42,- 81.55 අතර මෙම අලංකාර දූපත පිහිටා ඇත. දිග සැතපුම් 266ක්ද පළල සැතපුම් 140ක් ද වන අතර වර්ග සැතපුම් 25,363 ක ප්‍රදේශයක් පුරා පැතිරී ඇත. ජනාව-ාස ඇත්තේ මින් පහෙන් එකක පමණය. සසඳා බැලීමේදී හයෙන් එකක ප්‍රමාණයකින් අයර්ලන්තයට වඩා කුඩාය. ඔලන්දය සහ බෙල්ජියම එකතු කල විට සෑදෙන තරම් විශාලත්වයකි.

මුහුදේ සාමාන්‍යයෙන් යන නැව්වලට යා නොහැකි තරමේ කුඩා ඇලකින් ඉන්දියාවෙන් වෙන් වී ඇති ලංකාව එක්තරා වකවානුවකදී ආසියා මහාද්වීපයේ ම කොටසක්ව තිබී පසු ව වෙන් වන්නට ඇතැයි යන්න සමහරෙකුගේ මතයයි. බ්‍රාහ්මීය වීර කතා වල ලංකා යනුවෙන් සඳහන් වන, බොහෝ කලකට ඉහත එක් පසෙකින් අප්‍රිකාවටද, අනෙක් පසින් කැතී වලටද යා වී තිබුණා යයි සැලකෙන විශාල භූමියකට මෙම දිවයිනද සම්බන්ධ වී තිබෙන්නට ඇතැයි සිංහලයන් අතර ජන ප්‍රවාදයක් පවතී. එම න්‍යාය සර් එමර්සන් ටෙනන්ට් පවසන පරිදි භූ විද්‍යා සමීක්ෂණ වල ප්‍රතිඵල වලට අනුව සත්‍යයෙන් බැහැර නොවේ. මන්ද යත්, තුන් වන කාල පරිච්ඡේදයේ මුල් කාලයේදී මුළු මහත් උත්තර ආසියාවද, ඉන්දියාවෙන් විශාල කොටසක්ද ජලයෙන් යටව තිබී ඇති අතර, අර්ධ ද්වීපයේ දකුණු පසට වෙන්නට මලක්කා සිට අරාබි වෙරළ යා කෙරෙන විශාල මහාද්වීපයක් ද පැවති බැවිනි. අද ද අරාබි මුහුදේ රළ බිඳෙන්නේ ලංකාව, කොරල් දූපත්, ලක්බදුව, මාල දිවයි-න්, සහ චාගොස් දූපත් සමූහය අසලිනි (පුරාණ ලෝකය, 322 පිටුව). මහාචාර්ය ඔවන්ස් ද ඉහත විස්තරය අනුමත කරමින් මෙසේ කියයි. ලංකාව වෙනම මහාද්වීපයක කොටසකි. ඉතා සුවිශේෂ වූ පුරාණ ගොඩබිම් සමූහයකින් ශේෂ වූවකි. සමස්තයක් ලෙස ගත් කල සිංහල ශාක වර්ග ඉන්දියාවට වඩා සුමාත්‍රා, ජාවා, බෝර්නියෝ වල දක්නට ලැබෙන ඒවාට වඩා සමාන කම් කියයි. ගාල්ලේ සිට ත්‍රිකුණාමලය දක්වා කැලෑව මැදින් හෝ කඳු තරණය කරමින් ඔබට රීසි තෙක් ඇවිද්දත්, ව්‍යාඝ්‍රයෙක්, හයනාවෙක්, එළුවෙක්, නියමාකාර කොටියෙක්, වෘකයෙක්, හිවලෙක්, ගැසිල්ලා හෝ ඇන්ටිලොප් වර්ගයේ මුවෙක් හෝ ගිජු ලිහිණියෙක් දක්නට නොලැබෙනු ඇත. ලංකාව තරම් විවිධ කාල පරිච්ජේද වලදී විවිධ ජන කොට්ඨාශ විසින් විවිධ නම් වලින් හඳුන්වන ලද අන් කිසිම රටක් ලෝකය තුල නැති තරම්ය. එමෙන්ම මෙම භූමිය තරම් විවිධාකාර තර්ක විතර්ක වලින් ගහණ වළාකුළු පොදි ගැහුණු, කරකැවුණු වෙනත් ගෝලාකාර වස්තුවක්ද නැත. ප්ලිනි සහ ස්ට්‍රැබෝ යන දෙදෙනාම ඒ බව ප්‍රකාශ කර ඇත. දියෝනිසිස් පෙරීගේටස් නමැති භූ විද්‍යාඥයා පවසන පරිදි ලංකාව අලි ඇතුන් ගේ අති උතුම් රාජකීය මාතාව ය. මහා ඇලෙක්සැන්ඩර් ගේ මිතුරන් වන ඔනෙසික්‍රිටස් සහ මෙගස්තීනු ද මෙම දිවයින රන් සහ මුතු වලින් ඉතා

*(සටහන බී)*
*සිය හය වන මුහුදු චාරිකාවේදී ලංකා වෙරළ තීරයේදී සින්බෑඩ්ගේ නැව මුහුදුබත් විය. එය සිදු වී ඇත්තේ පළිඟු සහ පද්මරාග බහුල කන්දක් ආසන්න මුහුදේදීය. පහුරක් තනා ගත් ඔහු එහි නැගී පොලව යටින් දිවෙන දිය පහරක් ඔස්සේ දින කිහිපයක් තිස්සේ අඳුරේ' පාවී ගියේය. දිනක් ඔහු නින්දෙන් ඇහැරෙන විට තමා තැනිතලා බිමක සිටින බව දුටුවේය. නීග්‍රෝ ජාතිකයින් වැනි පිරිසක් ඔහු වටා සිටි අතර ඔවුහු කඩිනමින් සින්බෑඩ් සහිත පහුර ගං ඉවුරට තල්ලු කරමින් සිටියහ. ඉන් එකෙකු අරාබි භාෂාවෙන් ඔහු ඇමතීය.*

*සහෝදරය, බය වෙන්න එපා. අපි මේ රටේ පදිංචි කරුවෝ වෙමු. අපේ කෙත්වතු වලට වතුර ගැනීමට ළඟ තිබෙන කන්දේ සිට ගලන මේ ගඟෙන් ඇල වේලි කැපීමට මෙහි පැමිණියෙමු යි පවසා රට මැද පිහිටි අග නගරය වෙත කැඳවා ගෙන ගොස් ඔවුන්ගේ රජු වෙත පමුණුවන ලද්දේය. සින්බෑඩ් ගේ මෙම භූගත චාරිකාව පිළිබඳ වික්‍රමය වර්'තමානයේ සිංහලයන් අතර පවතින විශ්වාසයන්ට එකතු වී තිබේ. ඒ අනුව සින්බෑඩ් පොලව යටින් රට තුලට පාවී ආ ගඟ සැබවින්ම පවතින්නකි. පැය දොලහකට වරක් ඇතිවන වඩදිය බාදියේ සුළු උස් පහත් වීම් වලට අනුකූලව එම දිය පහර මුහුදු මාර්'ගයන් හා සම්බන්ධ වේ. එය පොතුර්' ගේ ළිඳ යන නමින් හැඳින්වේ.*

*දිවයින පිළිබඳව විස්තර කරන සින්බෑඩ් එය දිගින් හා පලලින් පරසන් (ඉපැරණි පර්'සියානු දුර මිණුම් ඒකකයක්) අසූවක් පමණ වන අතර හරීයටම නිරක්ෂ රේ'ඛාවට පහතින් පිහිටා තිබෙන නිසා සෑම විටම දිවා කාලය සහ රාත්‍රී කාලය පැය දොලහ බැගින් වන බව කියයි.*

*රාජ මාලිගය පිළිබඳ විස්තර මෙසේ සඳහන් කරයි.*

*රජතුමා මහජනයා අභිමුඛයට එන්නේ ඇතෙකු පිට සවිකල සිංහාසනයක හිඳ ගෙනය. රජු සහිත ඇතාට ඉදිරීපසින් සහ පසුපසින් තානාන්තර දෙකකට අයිති නිලමේ වරු, හිතවතුන් සහ රාජ සභාවට අයත් අනෙකුත් පිරීස් ගමන් කරති. රජතුමා ගමන් කරන ඇතා පිටම නැග රජුට ඉදිරීපසින් සිටින රාජ පුරුෂයෙකුගේ අතේ රනින් සැදූ කුන්තායුධයකි. සිංහාසනයට පිටුපසින් සිටගෙන සිටින තවත් රාජ පුරුෂයෙකි. ඔහු අත රනින් කල සිලින්ඩරාකාර යෂ්ඨියකි. එහි ඉහල කොණේ අඩි භාගයක් පමණ දිග අඟලක පමණ ඝණකමින් යුතු මරකත මැණිකකි. රජුට ඉදිරීයෙන්, අත්‍යලංකාරයෙන් සරසන ලද ඇතුන් පිට නැගී රන් පැහැ සේද සළු පැළඳ ගත් දහසකින් පමණ සැදුම් ලත් ආරක්ෂක සේනාවක් ගමන් කරති. ගමන් මගේ ඉදිරීයෙන් යන්නෙක් මෙසේ කියා කෑ ගසයි.*

*සොලමන් රජුටද වඩා බල පරාක්‍රමයෙන් යුත් රාජාධිරාජ උතුමාණන් වඩින සේක. බලාපල්ලා.*
*ඔහුට පසු පසින් යන රාජ සේවකයෙක් සිය වාරය ගෙන මෙසේ කෑ ගසයි. මේ අධිරාජ්‍යය අති උතුම්ය. බල සම්පන්නය. ඒ වෙනුවෙන් දිවි පිදිය යුතුයි, දිවි පිදිය යුතුයි, දිවි පිදිය යුතුයි.*

*සිය හත් වෙනි මුහුදු ගමනේදීද සින්බෑඩ් නැවත වරක් ලංකාවට ආවේය. එවර ඔහු හරුන් අල් රෂීඩ් ගෙන් රජතුමා වෙත අගනා ත්‍යාගයක් ගෙනවුත් පිලිගැන්වීය. සින්බෑඩ් වෙනත් දූපතකට ගොඩ බැස කොල්ල කරුවන් විසින් අල්ලා ගනු ලැබුවේද, අලින්ගේ සුසාන භූමියක් සහ මරණාසන්න වු ඇතුන් ඒ බව දැන ගෙන එහි ළඟාවන ආකාරය ඔහු දුටුවේද ලංකාවේ සිට ආපසු යන ඒ ගමනේදීය.*

6 වන පිටට